**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පංතියේ IIIවැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට සහ 2 පංතියේ IIවැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග - 2017**

1.0 2017 අගෝස්තු 15 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සබරගමුව පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ** සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ විධිවිධාන අනුව **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පංතියේ IIIවැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර** තනතුරට හා 2 පන්තියේ 11 ශ්‍රේණියේ **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී** තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාග සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2.0 මෙම විභාග සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ කොමිෂන් සභාව විසින් බලය පවරනු ලබන ආයතනයක් විසින් පවත්වනු ලබන අතර, විභාග පැවැත්වෙන දිනයන් යථා කාලයේදී දන්වනු ඇත. මෙම විභාගය ප්‍රතිඵල අනුව රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 හි විධිවිධානයන් පරිදි දිස්ත්‍රික් ජනගහන අනුපාතය මත දිස්ත්‍රික් දෙකෙහි කුසලතා අනුපිළිවෙල අනුව සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන් සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන **තාක්ෂණ සේවයේ 3 පංතියේ III වැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර හා 2 පන්තියේ 11 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරු සඳහා තෝරා ගනු ඇත.**

3.0 පවතින පුරප්පාඩු ප්‍රමාණය - **3 පංතියේ III ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර** පුරප්පාඩු සංඛ්‍යාව 07 කි.
**2 පන්තියේ 11 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී විවෘත බඳවා ගැනීමේ** පුරප්පාඩු සංඛ්‍යාව 03 කි.
(සීමිත බඳවා ගැනීමේ පුරප්පාඩු 02 කි.)

ඉදිරියේදී ඇතිවන පුරප්පාඩුද මෙම විභාග ප්‍රතිඵල මත සම්පූර්ණ කරනු ලබන අතර, පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. සීමිත තරඟ විභාග මගින් පිරවීමට නියමිත පුරප්පාඩු වලට ප්‍රමාණවත් අයදුම්කරුවන් නොසිටින්නේ නම් එම පුරප්පාඩුද, මෙම විවෘත විභාග ප්‍රතිඵල අනුව කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ. මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තීරණය ගැනීම මෙම කොමිෂන් සභාව සතුවේ.

4.0 **වැටුප :**

(i) අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට අනුව සබරගමුව පළාත් **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පංතියේ** III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MT-1-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 29,840- 10×300- 11×350-10×560-10×660- රු.48,890/- වේ. (ඉහත චක්‍රලේඛයේ II වන උප ලේඛනය අනුව වැටුප් ගෙවීම සිදුකෙරේ)

(ii) අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛයට අනුව සබරගමුව පළාත් **තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 පංතියේ** II වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN-6-2016 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 36585/-- 10×660- 11×755-15×930-රු.65,440/- වේ.
(ඉහත චක්‍රලේඛයේ II වන උප ලේඛනය අනුව වැටුප් ගෙවීම සිදුකෙරේ)

5.0 සුදුසුකම්.

5.1 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, **3 පංතියේ** III වැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීම

(1) අධ්‍යාපන සුදුසුකම්

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා.පෙළ) විභාගයෙන් භාෂාව, ගණිතය සහ ඉංග්‍රීසි භාෂාව ඇතුළුව සම්මාන පහක් (05) සහිතව විෂයයන් හයකින් (06) එකවර සමත්වීම

(2) වෘත්තීය සුදුසුකම්

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක තොරතුරු පාඨමාලාවක් හදාරා තිබීම.

(3) වෙනත්

(අ) සබරගමුව පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,තනතුරේ රාජකාරී ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත, ශ්‍රී ලංකා පුරවැසියකු විය යුතුය.

(ආ) අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(ඇ) අයදුම්පත් කැඳවනු ලබන දිනට අයදුම්කරු සබරගමුව පළාත තුල ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03 ක ස්ථිර පදිංචි නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා අයදුම්පත් කැඳවනු ලබන දිනට පූර්වාසන්න වසර 03 ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(ඈ) සේවයට පත් කිරීම සඳහා වන තරඟ විභාගවලට පෙනී සිටීම සඳහා අවම සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු ඉහත (1) හා (2) හි සඳහන් සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබේ නම් පමණි.

(ඉ) බඳවා ගන්නා අවම වයස අවුරුදු 18 යි. උපරිම වයස අවුරුදු 35 යි.

සටහන - සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදාල සියළු සුදුසුකම් 2017.10.31 වැනි දින හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

(4) විභාග පරිපාටිය

- ලිඛිත ප්‍රශ්න පත්‍ර දෙකකි.

(1) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - (කාලය පැය 02 යි - ලකුණු 100 යි)
(2) අභියෝග්‍යතාවය - (කාලය පැය 01 යි - ලකුණු 100 යි)

(1). තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය ප්‍රශ්න පත්‍රය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය දැනුම, මෙහෙයුම් පද්ධතීන්, මෘදුකාංග (වදන් සැකසුම, පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණය ඇතුළුව ) දෘඩාංග, අන්තර්ජාලය සහ ඉලෙක්ට්‍රොනික් තැපෑල ආදී ක්ෂේත්‍ර වලින් තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ව්‍යුහගත හා බහුවරණ ප්‍රශ්නවලින් සමන්විත වේ.

(2). අභියෝග්‍යතාවය - සංඛ්‍යාලේඛණාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න පත්‍රයකි. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.

5.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ, 2 පන්තියේ 11 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීම

(1) අධ්‍යාපන සුදුසුකම්

(i) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම

හෝ

(ii) (අ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් සහිතව උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ විය යුතුය.)

සහ

(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

හෝ

(iii) (අ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම

සහ

(ආ). විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

හෝ

(iv) (අ). තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත 07 මට්ටමෙ ප්‍රවීණතාවයක් ලබා තිබීම

සහ

(ආ). අදාල ක්ෂේත්‍රයේ වසර 02 ක වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම

(v) ඉහත 5.0 ඡේදයේ අංක (3) යටතේ වෙනත් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(vi ) බඳවා ගන්නා අවම වයස අවුරුදු 21 යි. උපරිම වයස අවුරුදු 35 යි.

(vi i ) විභාග පරිපාටිය -

- ලිඛිත ප්‍රශ්න පත්‍ර තුනකි.

1. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය - කාලය පැය 02 යි

11. අභියෝග්‍යතාවය - කාලය පැය 01යි

111. සාමාන්‍ය බුද්ධිය - කාලය පැය 01යි

( 1) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මූලධර්ම පරිගණක නිර්මිතය හා මෙහෙයුම් පද්ධති, මෘදුකාංග (වදන් සැකසුම පැතුරුම්පත්, ඉදිරිපත් කිරීම්, දත්ත සමුදාය කළමනාකරණ සහ කාර්යාල වල භාවිතාවන වෙනත් මෘදුකාංග පැකේජ) දෘඩාංග,දත්ත සන්නිවේදනය හා පරිගණක ජාල, අන්තර්ජාලය, වෙබ් අඩවි නිර්මාණය සහ නව අන්තර්ජාල සේවාවන්, ඉලෙක්ට්‍රොනික් තැපෑල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ජීවන චක්‍රය ආදී ක්ෂේත්‍ර වලින් දැනුම හා අධීක්ෂණ හැකියාව පරීක්ෂා කරනු ලැබේ.

(11) අභියෝග්‍යතාවය - සංඛ්‍යාලේඛණාත්මක හැකියාව, තර්කානුකූල කරුණු දැක්වීම පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරවණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50 කින් සමන්විත වේ.

(111) සාමාන්‍ය බුද්ධිය - සංඛ්‍යාත්මක හැකියාව හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවයන්ට අදාලව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාවය, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්වයන්ට අදාල කර ගැනීමේ හැකියාව, නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. බහුවරවණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න වලින් සමන්විත වේ.

සටහන - මෙම විභාග තරඟ විභාගයන් වුවද එක් එක් විෂය සඳහා වෙන්කර ඇති ලකුණු වලින් යටත් පිරිසෙයින් 40% ක් වත් අපේක්ෂකයා විසින් සමත්වීම සඳහා ලබා ගත යුතු අතර, විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් සමත්වීම සඳහා ලබාගත යුතු වේ.

6.0 විභාග මාධ්‍යය - මෙම විභාග සිංහල , දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පවත්වනු ලැබේ. අපේක්ෂකයන්ට සිය මනාපය පරිදි මින් එක් භාෂා මාධ්‍යයකින් පමණක් මෙම විභාගයට පෙනී සිටිය හැකි අතර ඉල්ලුම් කරන ලද මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

7.0 විභාග මධ්‍යස්ථානය - විභාග රත්නපුර හා කෑගල්ල නගර වල පිහිටුවන මධ්‍යස්ථාන වලදී පැවැත්වීමට අදහස් කර ඇත. අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටියහොත් විභාගය රත්නපුර නගරයේ පිහිටුවන මධ්‍යස්ථානවල පමණක් පවත්වනු ලැබීමට ඉඩ ඇත.

8.0 විභාග ගාස්තු - එක් විභාගයකට විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට / දෙපාර්තමේන්තුවකට ( පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම්පතේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. එම විභාග ගාස්තුව ගෙවිය යුත්තේ සබරගමුව පළාත් සභා ආදායම් ශීර්ෂ 20.03.02.99 ට බැරවන ලෙසය. ගෙවනු ලබන විභාග ගාස්තුව කිසිදු හේතුවක් මත ආපසු ගෙවනු නොලබන අතර, මුදල් ඇණවුම්, මුද්දර භාරගනු නොලැබේ. මුදල් ගෙවා ලබා ගන්නා ලද කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගත යුතුවේ.

## 9.0 අයදුම්පත්‍ර :

ඒ 4 ( සාමාන්‍ය හාෆ්ෂීට් ) ප්‍රමාණයේ කඩදාසි භාවිත කරමින්,

(අ) අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද,

(ආ) අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලටද, ඇතුලත් වන සේ කඩදාසියේ දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අදහස් කරන භාෂාවෙන් තම අත් අකුරින්ම පැහැදිලිව අයදුම්පත්‍රය පිරවිය යුතුය.

(ඇ) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසිපරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ඉල්ලුම් පත්‍රයට අනුකූලද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතුවේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

9.1 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

9.2 **සබරගමුව පළාත් රාජ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 3 පන්තියේ 111 ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට අයදුම්පත ඉදිරිපත් කරන්නේ නම්, "3 පන්තියේ III වැනි ශ්‍රේණියේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2017"** යනුවෙන්ද, 2 පන්තියේ 11 ශ්‍රේණියේ තොරතුරු **හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී** තනතුරට අයදුම්පත ඉදිරිපත් කරන්නේ නම්, "2 පන්තියේ 11 ශ්‍රේණියේ තොරතුරු **හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2017"** යනුවෙන්ද, හා **ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයද** අයදුම්පත්‍රය බහා එවන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ සඳහන් කරන්න.

9.3 අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු, වාර්ෂික වැටුප රු. 240,360/- ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු විසින් හෝ සහතික කරනු ලැබ තිබිය යුතුය.

9.4 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍ර 2017.10.31 වන දිනට හෝ ඊට පෙර **"ලේකම්, පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, සබරගමුව පළාත, සබරගමුව පළාත් සභා සංකීර්ණය, නවනගරය, රත්නපුර"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**10.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**11.0 ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්**

ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාගයෙන් පසු හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

**12.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් , ඒ සම්බන්ධව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වේ. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

සුනේත්‍රා ගුණවර්ධන
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
සබරගමුව පළාත.

2017.10.
සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
සබරගමුව පළාත් සභා සංකීර්ණය,
නවනගරය, රත්නපුර.

**ආදර්ශ අයදුම්පත්‍රය**
**සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ**
**තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර 3 පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ**
**විවෘත තරඟ විභාගය - 2017**

---

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2 දෙමළ - 3 [ ]
( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

[ ]
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**1.0** **1.1** මුල’කුරු අගට යොදා මුල’කුරු සමඟ නම
..................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..........................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ..........................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැදුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

**2.0** 2.1 ස්ථිර ලිපිනය ..........................................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
..........................................................................................

2.2 ස්ථිර ලිපිනය ..........................................................................................................
( සිංහලෙන් / දෙමළෙන්) ..........................................................................................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ..........................................................................................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................

2.4 දුරකථන අංකය - (ස්ථිර/ජංගම) ..........................................................................................

**3.0** 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය රත්නපුර 1 [ ]
කෑගල්ල 2

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ................................ ( කොටුව තුළ අදාළ

3.3 පදිංචිව සිටින කාලසීමාව .................................... අංකය ලියන්න)

3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය ....................................

**4.0**

4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 [ ]
පුරුෂ - 2 ( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.1 උපන්දිනය වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

4.2 2017 ඔක්තෝම්බර් 31 වන දිනට වයස
අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

**5.0** අධ්‍යාපන සුදුසුකම්

5.1 අ.පො.ස(සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර (සහතිකයේ පිටපතක් අමුණන්න)

I . විභාගයේ වර්ෂය හා මාසය :....................................

II. විභාග අංකය :..........................................

III. ප්‍රතිඵල

| **විෂයය** | **ශ්‍රේණිය** | **විෂයය** | **ශ්‍රේණිය** |
|---|---|---|---|
| 1 | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය පිළිබඳව හදාරා ඇති පාඨමාලාවන් (NVQ) පහ (05) මට්ටමේ හෝ ඊට ඉහළ පරිගණක තොරතුරු පාඨමාලාවක් විය යුතුය. සහතිකයේ පිටපතක් අමුණන්න.)

| පාඨමාලාවේ නම | පාඨමාලාව පැවැත්වූ ආයතනයේ නම | පාඨමාලා කාලය |
|---|---|---|
| | | |

**6.0** වෙනත් සුදුසුකම් ..........................................................................................

**7.0** ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ? ( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| | | | |
|---|---|---|---|
| ඔව් | | නැත | |

**8.0** විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය ..........................................................................

(ii) ලදුපතේ අංකය හා දිනය ..........................................................................

(iii) ගෙවූ මුදල ..........................................................................................

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න<br>*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)* |
|---|

**9.0** අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

...................................... ......................................

දිනය අයදුම්කරුගේ අත්සන

**10.0** අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන........................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී ......................... දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය ................ සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේනම.................................................

තනතුර.......................................

ලිපිනය.......................................

( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

**11.0** රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකයද ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිලධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ.........................දිනසිට.............................................................

තනතුරේ සේවය කරන ......................................................මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිඳු විනය දඩුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරණ තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

..............................................

නම....................................................... දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය

පදවිය.................................................. පවරනු ලබන නිළධාරියාගේ අත්සන

දිනය....................................

දෙපාර්තමේන්තුව/ආයතනය

# ආදර්ශ අයදුම්පත්‍රය
## සබරගමුව පළාත් රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී 2 පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය
සිංහල - 2 දෙමළ - 3 [ ]
( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

[ ] (කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**1.0** **1.1** මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : PERERA, A.B.C

1.2 සම්පූර්ණ නම ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම ..............................
( සිංහලෙන් / දෙමළෙන්)

1.4 ජාතික හැඳුනුම්පත් අංකය [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

**2.0** 2.1 ස්ථිර ලිපිනය ..............................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

2.2 ස්ථිර ලිපිනය ..............................
( සිංහලෙන් / දෙමළෙන්) ..............................

2.3 ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය ..............................
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..............................

2.4 දුරකථන අංකය - (ස්ථිර/ජංගම) ..............................

**3.0** 3.1 අයදුම්කරු ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය රත්නපුර 1
කෑගල්ල 2 [ ]
( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

3.2 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ..............................

3.3 පදිංචිව සිටින කාලසීමාව ..............................

3.4 ග්‍රාම නිලධාරී කොට්ඨාශය ..............................

**4.0**
4.1 ස්ත්‍රී/ පුරුෂ භාවය ස්ත්‍රී - 1 [ ]
පුරුෂ - 2 ( කොටුව තුළ අදාළ අංකය ලියන්න)

4.1 උපන්දිනය වර්ෂය [ ][ ][ ][ ] මාසය [ ][ ] දිනය [ ][ ]

4.2 2017 ඔක්තෝම්බර් 31 වන දිනට වයස
අවුරුදු [ ][ ] මාස [ ][ ] දින [ ][ ]

5.0 අධ්‍යාපන සුදුසුකම්

1. ලබා ඇති උපාධිය හා වර්ෂය ..........................................................................
   විශ්ව විද්‍යාලය හෝ ආයතනය..........................................................................

11. පශ්චාත් උපාධි ඩිප්ලෝමාව/පශ්චාත් උපාධිය ..........................................................................
    ලබාගත් ආයතනය හා වර්ෂය..........................................................

(උපාධි සහතිකයේ හා පශ්චාත් උපාධි/පශ්චාත් උපාධි ඩිප්ලෝමා සහතිකයේ පිටපත් ඇමිණිය යුතුය.)

6.0 පළපුරුද්ද ..........................................................................................

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
( අදාළ කොටුවේ √ ලකුණ යොදන්න) (ඔව් නම් විස්තර සඳහන් කරන්න)

| ඔව් | | | නැත | |
|---|---|---|---|---|

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර

(i) විභාග ගාස්තු ගෙවූ කාර්යාලය ..........................................................

(ii) ලදුපතේ අංකය හා දිනය ..........................................................................

(iii) ගෙවූ මුදල ..........................................................................................

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න
*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

9.0 අයදුම්කරුගේ සහතිකය

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බවත්, ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද, මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

(ආ) මවිසින් කරනු ලබන මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බව ද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

.......................................                                   .......................................
දිනය                                                                     අයදුම්කරුගේ අත්සන

10.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන........................................................ මයා / මිය / මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු / ඇය මා ඉදිරිපිට දී ........................ දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බව ද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බව ද එම ලදුපත අලවා ඇති බව ද සහතික කරමි.

දිනය ................. ......................

සහතික කරන නිලධාරියාගේ අත්සන

සහතික කරන නිලධාරියාගේනම..................................................
තනතුර.........................................
ලිපිනය........................................
( නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

11.0 රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවකු නම් පහත සඳහන් සහතිකයද ආයතන ප්‍රධානියා, දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරා ඇති නිළධාරියකු විසින් කළ යුතුය.

(අ) මෙම දෙපාර්තමේන්තුවේ...........................දිනසිට..........................................................තනතුරේ සේවය කරන ..........................................................මහතා/මහත්මිය/මෙනවිය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට උපයාගත යුතු සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාද කිරීම් හැර කිසිඳු විනය දඬුවමකට භාජනය වී නොමැති බවත්, අයදුම්පතේ සපයා ඇති විස්තර නිවැරදි හා සත්‍ය බවත් සහතික කරමි.

(ආ) ඉහත තනතුර සඳහා ඔහු/ඇය තෝරා ගතහොත් අයදුම්කරු දැනට දරණ තනතුරෙන් මුදා හැරිය හැකි / නොහැකි බවත් දන්වමි.

..........................................................................

දෙපාර්තමේන්තු ආයතන ප්‍රධානියා හෝ බලය පවරනු ලබන නිළධාරියාගේ අත්සන

නම........................................................
පදවිය..................................................
දිනය.....................................
දෙපාර්තමේන්තුව/ආයතනය